# 12 අපේකම සුරකිමු

අප ඉගෙනුම ලබන පාසල අනෙකුත් පාසල්වලට වඩා අපට වැදගත් වන්නේ එය අපේ පාසල යැයි අප සිතන නිසා ය. අපේ පාසල අනෙකුත් පාසල්වලින් වෙන් කොට හැඳින ගත හැකි අනන්‍යතා ලක්ෂණ කිහිපයක් ඇත. පාසල් කොඩිය, පාසල් ගීතය ඒ අතර වඩා වැදගත් වේ. සිසුන් වශයෙන් අපි ඒවාට ගරු කරමු. රටක් පිළිබඳ අවධානය යොමු කළ විට ද ඕනෑ ම රටක් සතු ව, එම රට තවත් රටකින් වෙන් කොට හැඳින ගත හැකි විශේෂ ලක්ෂණ රැසක් පවතී. සියලු රට වැසියෝ, එම ලක්ෂණ විදහා දක්වන සංකේතවලට ගරු කරති.

අපේ රට ශ්‍රී ලංකාවයි. මෙරට ජීවත් වන සැවොම ශ්‍රී ලාංකිකයෝ ලෙස සැලකෙති. අපි අපේ මාතෘ භූමිය වන්දනීය ලෙසත් පූජනීය ලෙසත් සලකමු. එම නිසා අප, රටට ආවේණික ජාතික සංකේත නිවැරැදි ව හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය අපේ රටේ ජාතික සංකේත අතර අතිශය වැදගත් ය. මෙම සංකේත ජාති ආගම් භේදයකින් තොර ව අප රටේ අනන්‍යතාව ලෝකයාට ම පෙන්නුම් කරයි.



# ජාතික කොඩිය

ජාතික කොඩිය යනු රටක අනන්‍යතාව ලොවට පෙන්වන ප්‍රධාන සංකේතයකි. ශ්‍රී ලාංකිකයින් වශයෙන් අපේ ජාතික කොඩියට ගරු කළ යුතු හේතු සාධක රැසක් ඇත. අපගේ ජාතික කොඩිය සිංහල ජාතිය ද මෙරට ජීවත් වන අනෙකුත් සියලු ජාතීන් ද බුදු දහම මෙන් ම සියලු ආගම් ද පිළිබිඹු කරයි.

**ජාතික කොඩියෙහි අඩංගු සංකේත කිහිපයක අර්ථ**

- **කහ පාට සිංහයා** - සිංහල ජාතිය, සිංහල ජනතාවගේ විනයගරුක බව, නිර්භීතකම, අභිමානය, නායකත්වය හා සාධාරණත්වය විදහා දක්වයි.

- **අසිපත** - ධාර්මික ව නීත්‍යානුකූල ව යුක්තිගරුක ව රට පාලනය කරමින් මවුබිමේ ආරක්ෂාව උදෙසා නැඟී සිටීම පෙන්නුම් කරයි.

- **බෝපත් සතර** - බුදු දහමේ ඉතා වැදගත් ඉගැන්වීමක් වන මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ මූර්තිමත් කරයි.

- **තද රතු පාට** - ශ්‍රී ලාංකික ජනතාවගේ ජීව රුධිරය පෙන්නුම් කරන අතර කොළ හා තැඹිලි පැහැ සිරස් පටි දෙකින් දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු අනෙකුත් ජාතීන් නියෝජනය කරයි.

- **කහ තීරුව** - සියලු ජාතීන් අතර එකමුතුව ද එකිනෙකා අතර අවබෝධය ද නිරූපණය වෙයි.

**ජාතික කොඩිය පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු**

- ජාතික කොඩිය රැගෙන යාමේ දී එහි යෂ්ටිය ඍජු ව තබා ගැනීම
- ක්‍රීඩා උත්සවවල දී හෝ වෙනත් අවස්ථාවල දී හුදු විනෝදය උදෙසා ජාතික කොඩිය පරිහරණය නොකිරීම
- කිසිදු අවස්ථාවක එය බිම නොතැබීම
- ජාතික කොඩිය ඔසවන අවස්ථාවල දී සියලු දෙනා ම නැඟී සිට සීරුවෙන් සිටීම
- සිංහ රූපයේ පාද පහළට සිටින සේ කොඩිය එසවීම
- ජාතික කොඩිය එස වූ විගස ජාතික ගීය ගායනය කිරීම
- හානියට පත් වූ හෝ අවලක්ෂණ වූ කොඩියක් නොඑසවීම

## ජාතික ගීය

අප රටෙහි අනන්‍යතාව ලොව හමුවේ පෙන්නුම් කරන තවත් වටිනා සංකේතයක් ලෙස ජාතික ගීය සැලකිය හැකි ය. එය ආනන්ද සමරකෝන් මහතා විසින් රචනා කරන ලද්දකි. ඒ මඟින් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කෙරෙන්නේ තම රට පිළිබඳ අභිමානය ජනිත කරවීම ය. මාතෘ භූමියේ සෞන්දර්යය හා සෞභාග්‍යය ජාතික ගීයෙන් පැවසෙයි. එමෙන් ම ජයග්‍රහණය කරා යන ගමනේ දී බුදු දහමේ ද පෙන්වා දෙන,

- නැණවත් බව
- උත්සාහය
- එක ම මවකගේ දරු පිරිසක් මෙන් ක්‍රියා කිරීම

ආදී ගුණාංගවල වැදගත්කම එමඟින් අවධාරණය කෙරේ. ජාතික ගීය එක් ජනවර්ගයකට පමණක් විශේෂ වූවක් නොවේ. එය ගායනා කරනු ලබන විට සියලු දෙනා ම සීරුවෙන් නැගී සිටිය යුතු අතර එහි අරුත සිහි ගන්වමින් අභිමාන පෙරදැරි ව ගායනා කළ යුතු ය. ඇසෙන සැණින් අනෙකුත් කටයුතු නවතා හිටිවන ම ඊට ගරු බුහුමන් දැක්විය යුතු ය. ගායනා කිරීමෙන් පසු ව හිස නමා ආචාර කළ යුතු ය.

## ජාතික වෘක්ෂය



ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නා ගස ය. එම වෘක්ෂය ජාතික මෙන් ම ආගමික වශයෙන් ද අපට වැදගත් වේ. මංගල, සුමන, රේවත, සෝභිත යන බුදුරජාණන් වහන්සේලා බුද්ධත්වයට පත් වී වදාළේ නා ගස් සෙවණෙහි ය. මෛත්‍රී බුදුරදුන් බුදු බව ලැබීමට නියමිත බව පැවසෙන්නේ ද නා ගස් සෙවණක ය. එනිසා නා වෘක්ෂය බෝධීන් වහන්සේ නමක් ලෙස සැලකීමට හැකි වන අතර එය දෙවෙනි වන්නේ ඇසතු බෝධි වෘක්ෂයට පමණි. නාමල් පිදීම මහානිසංස ගෙන දෙන පිංකමක් ලෙස ද බෞද්ධයෝ පිළිගනිති. ඉතා ශක්තිමත්, දීර්ඝ කාලයක් පවත්නා වෘක්ෂයක් වන නා ගස ජාතියේ ශක්තිය හා චිර පැවැත්ම මූර්තිමත් කරයි.

නා මලින් ඉතා සෞම්‍ය, මිහිරි සුවඳක් වහනය වන අතර නා දලුවේ වර්ණය ඕනෑ ම අයෙකුගේ සිත් ඇද බැඳ ගන්නේ නිරායාසයෙනි. ජාතික මෙන් ම ආගමික වශයෙන් ද වැදගත් වන නා වෘක්ෂය ආරක්ෂා කිරීමට ද ඊට ගරු කිරීමට ද අපි කුඩා කල සිට ම පුරුදු වෙමු.

## ජාතික පුෂ්පය




ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය නිල් මහනෙල් මල ය. එය නිවැරැදි ව හැඳින ගැනීම ඉතා වැදගත් ය. මහනෙල් මල බුදුරදුන්ගේ සිරි පතුලේ ඇතුළත් එකසිය අටක් වූ මංගල සංකේතවලින් එකකි. එය සුගන්ධවත් ය. පවිත්‍රත්වයෙන් යුක්ත ය. මෙම කරුණු නිසා මහනෙල් මල අතීතයේ සිට ම මංගල සංකේතයක් ලෙස බෞද්ධයන් විසින් සලකනු ලැබේ.

එය දිය මත්තෙහි පිහිටා ඇති ආකාරය දුටු විට බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය සිහි ගැන්වෙන්නේ නිරායාසයෙනි. රාජකීය උත්සව සඳහා අනාදිමත් කාලයක සිට මෙම මල භාවිත කරනු ලැබ ඇත. බලවත් රෝග සමනය කිරීමට සමත් සිසිල් ගුණයක් සහිත ඖෂධීය පුෂ්පයක් ලෙස ද නිල් මහනෙල් මල සැලකේ.


අප රට තුළ විවිධ ජාතීහු මෙන් ම විවිධ ආගමිකයෝ ද වාසය කරති. අප සියලු දෙනාගේ ම රට ශ්‍රී ලංකාවයි. එනිසා මෙහි දක්වන ලද ජාතික සංකේතවලට සියලු දෙනා ම ගරු කළ යුතු ය. සියලු ජාතීන් අතර සමගිය හා සාමය වැඩි දියුණු කර ගැනීමට එය ප්‍රබල උපකාරයක් වෙයි.

## සාරාංශය



- ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය අපේ රටේ ප්‍රධානතම ජාතික සංකේත ලෙස සැලකේ.
- ජාතික සංකේත රටක අනන්‍යතාව පිළිබිඹු කරයි.
- ජාතික සංකේතවලින් පැවසෙන අර්ථ නිවැරැදි ව වටහා ගැනීම වැදගත් ය.
- භේදයකින් තොර ව සංකේතවලට ගරු කිරීම අප සියලු දෙනාගේ ම වගකීමයි.

## ක්‍රියාකාරකම



1. ජාතික කොඩියෙහි ඇතුළත් සංකේත හතරක් නම් කරන්න.
2. එම සංකේතවලින් අදහස් කෙරෙන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
3. ජාතික කොඩියට ගරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න.

## පැවරුම



ඔබේ අභ්‍යාස පොතෙහි ජාතික කොඩිය අඳින්න.